රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 188.

මගේ අංකය: පේ/ඒ 11/1.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1981 පෙබරවාරි මස 26 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්. සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතටයි.

විදුලි බල ඉතිරි කිරීම.

විදුලිබලය හැකිතාක් දුරට ඉතිරි කිරීමෙහිලා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබෙන් කාරුණිකව ඉල්ලා සිටීම ඉතාමත්ම අත්‍යවශ්‍ය කරුණක් වී තිබේ.

2. විදුලි බලය කැපීම් පස්වරුවේ සිදුවන ප්‍රදේශවල පිහිටි කාර්යාලවල නිලධාරීන් ගෙදර යන විට/විදුලි පහන්, විදුලි පංකා හා විදුලි උපකරණ නිවීම නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විදුලි බලය කැපීමේ කාල සීමාව අවසන්වූ විට විදුලි පහන්, පංකා ආදිය නැවතත් ක්‍රියාත්මක වේ. මෙයින් විශාල වශයෙන්ම විදුලි බලය අපතේ යැමක් පසුදා පෙරවරුව තෙක්ම සිදුවන්නේය.

3. විදුලි බලය ඉතිරි කිරීම ගැන වගකිව හැකි නිලධාරියෙකු හෝ නිලධාරීන් තම-තමන්ගේ කාර්යාලවල/උපකාර්යාලවල පත් කරන මෙන් ඔබ සැමගෙන්ම කාරුණිකව ඉල්ලුම් කරනු ලැබේ. එවැනි නිලධාරියෙකු හෝ නිලධාරීන් නම් වශයෙන් හා නිල නාම වශයෙන් නිශ්චිතව පැවරිය යුතු අතර, එදිනෙදා අවසානයේදී විදුලි පහන්, විදුලි පංකා, වායු-සමීකරණ ආදී යන්ත්‍ර නිවීම පමණක් නොව, දිවා කාලය තුළදීත් අනවශ්‍ය ලෙස ක්‍රියා කෙරෙන විදුලි පහන්, විදුලි පංකා ආදිය නිවීමේ කටයුත්ත ද පිළිබඳව වගකීම භාර ගන්නා ලෙස ඔහුගෙන්/ඔවුන්ගෙන් ඉල්ලුම් කර සිටිය යුතුය.

4. දැඩි විදුලි බල හිඟයක් පවතින මේ අවස්ථාවේදී, වායු-සමීකරණ යන්ත්‍ර සහිත කාමරවල සේවය කරන නිලධාරීන් එම යන්ත්‍ර ක්‍රියා කරවීමෙන් වළකින ලෙස විශේෂයෙන්ම ඉල්ලුම් කරනු ලැබේ.

5. විදුලි බලය කැපීම ක්‍රියාත්මක වීමට ස්වල්ප වේලාවකට කලින් විදුලි පහන්, විදුලි පංකා ආදිය නිවා දැමීම වඩාත්ම යෝග්‍ය බැව් පෙන්වා දෙනු කැමැත්තෙමි.

Siriwardhana

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ
ලේකම්.

රජ/25.